# Abstract No 85

## ජ්‍යෝතිශ්ශාස්ත්‍රයේ අන්තර්ගත 'පඤ්චාංගයෙ'හි වැදගත්කම පිළිබඳ සන්නිදර්ශනාත්මක අධ්‍යයනයක්

**පී. ඩිල්ෂානි චතුරිකා දාබරේ**

ලොව ඉපැරණි ම විද්‍යාවක් වශයෙන් සැලකෙන ජ්‍යොතිර් විද්‍යාව භාරතීය වේදාංග අතර ප්‍රමුඛතම අංගය වන්නේ ය. සංස්කෘත භාෂාවෙන් 'ආලෝකය' (ज्योतिः) යනාර්ථයෙන් ද, ඉංග්‍රීසි භාෂාවෙන් 'තාරකාශාස්ත්‍රය' (Astrology) යනාර්ථයෙන් ද හඳුන්වන මෙය භාරතය මතු නොව බැබිලෝනියාව, ඊජිප්තුව, චීනය ආදි පෙර'පර දෙදිග රටවල ද ව්‍යාප්ත වූවකි. හින්දු විශ්වාසයන්ට අනුව ජ්‍යෝතිර් විද්‍යාව මහාබ්‍රහ්මයා විසින් නාරද ඍෂිවරයාට උගැන්වූවකි. වරාමිහිර, කේ. එස්. ක්‍රිෂ්ණමූර්ති ආදි භාරතීය පුරෝගාමීන් හේතුවෙන් මෙය විද්වතුන්ගේ අවධානයට ලක් විය. ජ්‍යොතිර් ශාස්ත්‍රයේ අන්තර්ගත ප්‍රධාන අංග පහකි. දිනය (Date), නැකත (Auspicious Time), තිථිය (Lunar Day), යෝගය (Practice) සහකරණය (Making/ Doing) යන මේවා 'පඤ්චාඞගය' ලෙසින් හැඳින්වේ. ගණනින් දින සතකි; නැකැත් විසි හතකි. අභිජිත් නැකත ද සමග එකතුව නැකැත් විසි අටකි. තිථි පසළොසකි; යෝග විසි හතකි; කරණ එකොළොසකි. එදිනෙදා වැදගත් වැඩ කටයුතු නියමාකාරයෙන් ඉටුවනු දැකීමෙහි නොතිත් ජනයා මෙකී අංග පස සඳහන් වන ජන්ම පත්‍රයත් ලිතත් අවධානයට යොමු කළ ද ඊට අනන්‍ය වැදගත්කම නොදනිති. ඒ අනුව මෙම අධ්‍යයනයෙහි අරමුණ වූයේ දෛනික කටයුතුවල සාධනීයත්වය උදෙසා 'පඤ්චාඞගය' වැදගත් වන්නේ කෙසේ ද, එහි අනන්‍යතාව කවරේ ද යන්න සාහිත්‍යමය දත්ත ඇසුරින් විමසා බැලීම යි. මේ සඳහා ජ්‍යෝතිෂ්‍ය ග්‍රන්ථ, ශබ්දකෝෂ ග්‍රන්ථ, සිංහල සහ සංස්කෘත සාහිත්‍යයේ තෝරාගත් ග්‍රන්ථ මෙන් ම 2016 වසරේ ලිත ද මූලාශ්‍රය කොට ගැනිණි. අප කළ පර්යේෂණයෙන් අනාවරණය වූ පරිදි දිනයෙන් ආයුෂ වර්ධනය ද, නැකතින් පව් දුරුවීම ද, තිථියෙන් සැප සම්පත් වර්ධනය ද, යෝගයෙන් රෝග සහ බාධක නිවාරණය ද, කරණයෙන් අරමුණ ඉෂ්ට වීම ද යන මෙකී කාරණා සිදු වේ. ඍග්වේදය, රාමායනය යන සංස්කෘත සාහිත්‍ය ග්‍රන්ථවලත් සැළලිහිණි සන්දේශය, ථූපවංසය, දළදා සිරිත යන සිංහල සාහිත්‍ය ග්‍රන්ථවලත් යථෝක්ත විග්‍රහයට නිදසුන් හමු වේ. සාමාන්‍ය ජනතාව බහුල ව භාවිත කරන ලිතෙහි එන සංවත්සර පත්‍රය, ශුභ මුහුර්ත, කාල හෝරාව, පොහෝ පැවරීම, අලුත් අවුරුදු නැකැත් යන කරුණු සම්බන්ධයෙන් ද මෙය තහවුරු වේ. ලිත 'පඤ්චාංග ලිත' වශයෙන් නම් කරන්නේ එබැවිනි. මේ අනුව 'පඤ්චාඞගය' ජ්‍යෝතිශ්‍යයේ මූලික අඩිතාලම ලෙසින් විශේෂ කාර්යභාරයක් ඉටුකරන බව ගම්‍යමාන වේ.

**ප්‍රමුඛපදඃ**ජන්ම පත්‍රය, තාරකාශාස්ත්‍රය, පඤ්චාඞගය, මහාබ්‍රහ්මයා,  ශුභ මුහුර්ත